# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2034/29 - 2017 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(XVI)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තියේ (2) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2017 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2017 අංක 04 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවාලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. 2012 සැප්තැම්බර් මස 14 වැනි දින අංක 1775/22 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1996 පෙබරවාරි මස 09 වැනි දින අංක 909/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 12 වන ඡේදයෙහි -

(i) එහි (ඒ) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :-

''(ඔ) ජීවවෛද්‍ය විද්‍යා.''.

(2) එහි 22 වන ඡේදයෙහි -

(i) එහි 22 වන ඡේදයේ ''විද්‍යා විශේෂඥ ක්ෂෙත්‍රය'' යන යෙදුමේ අර්ථ නිරූපනයෙහි ''සංඛ්‍යා ලේඛනය සහ පරිගණක විද්‍යාව හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් කවර වුව ද විශේෂඥ ක්ෂේත්‍රයක් '' යන වචන වෙනුවට ''සංඛ්‍යා ලේඛනය සහ පරිගණක විද්‍යාව, ජීව වෛද්‍ය විද්‍යාව හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් කවර වුව ද විශේෂඥ ක්ෂේත්‍රයක් '' යන වචන ආදේශ කිරීමෙන් ''.

09-367